| ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය **පෙබරවාරි 2017** | # ශ්‍රී ලංකා ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය |
|---|---|

**සංඛ්‍යාන දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා මහ බැංකුව**


නිෂ්පාදන සහ සේවා කටයුතු වලට අදාල ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශක සමීක්ෂණයෙහි ප්‍රතිඵල


වැදගත් කරුණු:

- **නිෂ්පාදන අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය** 2017 පෙබරවාරි මාසයේ දී 57.1 ක දර්ශක අගයක් වාර්තා කරමින් 2017 ජනවාරි මාසයට සාපේක්ෂව දර්ශක අගයයන් 0.9 කින් ඉහළ යන ලදී. මෙම ඉහළ යෑම තුළින්, පෙබරවාරි මාසයේ දී ද නිෂ්පාදන ක්‍රියාකාරකම්හි අඛණ්ඩ වර්ධනය පිළිඹිබු වන අතර, මේ සඳහා එළඹෙන උත්සව සමය සඳහා ඇති නව ඇණවුම් වල ඉහළ යෑම පෙන්නුම් කරමින් නව ඇණවුම් උප දර්ශකය සැළකිය යුතු ලෙස වර්ධනය වීම ප්‍රධාන වශයෙන් හේතු විය. රැස්කරගත් තොග භාවිතා කිරීම මෙන්ම ඇණවුමක් සැපයීමට සැපයුම්කරුවන්ට ගතවන කාලය යන උප දර්ශකය ඉහළ යෑම මඟින් ද පිළිබිඹු වන පරිදි, භාණ්ඩ තොග ලැබීම පමා වීම හේතුවෙන් ද ගැනුම් තොග උප දර්ශකය පෙබරවාරි මාසයේ දී පහත වැටුණි. මේ අතර, සේවා නියුක්ති උප දර්ශකය පසුගිය මාසයට සාපේක්ෂව ඉහළ ගිය අතර නිෂ්පාදන උප දර්ශකය නොවෙනස්ව පැවැතුණි. පෙබරවාරි මාසයේ වැඩ කරන දින ගණන සාපේක්ෂව අඩු වූ බැවින්, ඉහළ ගිය නව ඇණවුම් ප්‍රමාණයට අනුරූපව නිෂ්පාදනය වැඩි කිරීම කෙරෙහි බලපෑමක් ඇති කළ බව අනාවරණය විය. මෙහි දී සියලුම උප දර්ශක කඩඉම් මට්ටම ලෙස ගැනෙන දර්ශක අගය වන 50.0 ට වඩා වැඩි අගයක් වාර්තා කරන ලදී. මේ අතර, ඉදිරි මාස තුන සඳහා ව්‍යාපාර ක්‍රියාකාරකම් පිළිබඳ අපේක්ෂාවන් ද යහපත් වර්ධනයක් පෙන්නුම් කරන ලදී.

- **සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය** 2017 ජනවාරි මාසයේ දී වාර්තා වූ 57.5 ක දර්ශක අගයක සිට පෙබරවාරි මාසයේ දී 57.3 ක දර්ශක අගයක් දක්වා පහළ යන ලදී. පසුගිය මාසයට සාපේක්ෂව ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකයෙහි සිදු වූ මෙම සුළු පහළ යෑමෙන්, 2017 පෙබරවාරි මාසයේ දී සේවා අංශයෙහි ආර්ථික ක්‍රියාකාරකම් පසුගිය මාසයට සාපේක්ෂව අඩු වේගයකින් වර්ධනය වූ බව පෙන්නුම් කරයි. ව්‍යාපාර ක්‍රියාකාරකම් උප දර්ශකය අඩු වේගයකින් වර්ධනය වීම සහ නිම කිරීමට ඇති කාර්යයන් උප දර්ශකයෙහි සිදු වූ පහළ යෑම සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකයෙහි සිදු වූ මෙම පහළ යෑමට හේතු විය. 2017 ජනවාරි මාසය හා සැසඳීමේ දී පෙබරවාරි මාසයේ දී නව ව්‍යාපාර, සේවා නියුක්ති සහ අපේක්ෂිත ඉදිරි ව්‍යාපාර ක්‍රියාකාරකම් උප දර්ශක වර්ධනය විය. අය කරන මිල ගණන් (ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය ගණනය කිරීමේ දී සලකා නොබලන) 2017 පෙබරවාරි මාසයේ දී පසුගිය මාසයට සාපේක්ෂව පහළ යන ලදී. ශ්‍රම පිරිවැය පිළිබඳ අපේක්ෂා මගින් මනිනු ලබන ඉදිරි ශ්‍රම පිරිවැය 2017 පෙබරවාරි මාසයේ දී ඉහළ යන ලදී.

| | වs\මා | ජන. | පෙබ. | මාර්. | අප්‍රේ. | මැයි | ජූනි | ජූලි | අගෝ. | සැප්. | ඔක්. | නොවැ. | දෙසැ. |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| **නිෂ්පාදන අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය** | **2015** | n.a. | n.a. | n.a. | n.a. | 67.3 | 57.5 | 55.5 | 56.5 | 53.2 | 57.8 | 54.8 | 57.9 |
| | **2016** | 51.9 | 55.3 | 60.7 | 41.6 | 47.9 | 55.1 | 50.6 | 53.5 | 57.7 | 56.5 | 58.4 | 58.3 |
| | **2017** | 56.2 | 57.1 | - | - | - | - | - | - | - | - | - | - |
| **සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය** | **2015** | n.a. | n.a. | n.a. | n.a. | 66.8 | 65.0 | 60.6 | 59.8 | 61.7 | 59.5 | 59.3 | 60.2 |
| | **2016** | 58.0 | 59.3 | 61.6 | 54.7 | 58.1 | 56.3 | 57.8 | 61.2 | 57.7 | 59.3 | 59.7 | 59.8 |
| | **2017** | 57.5 | 57.3 | - | - | - | - | - | - | - | - | - | - |




සංඛ්‍යාන දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා මහ බැංකුව

තාක්ෂණික සටහන:

**දර්ශකය**

ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය 0 සිට 100 අතර අගයන් පරාසයක විහිදී ඇත.

ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය දර්ශක ඒකක 50 ට සමාන නම් අදාළ අංශය පසුගිය මාසය හා සැසඳීමේ දී නොවෙනස්ව පැවතී ඇත.

ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය දර්ශක ඒකක 50 ට වඩා වැඩි නම් අදාළ අංශය පසුගිය මාසය හා සැසඳීමේ දී වර්ධනයක් පෙන්නුම් කරයි.

ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය දර්ශක ඒකක 50 ට වඩා අඩු නම් අදාළ අංශය පසුගිය මාසය හා සැසඳීමේ දී සංකෝචනයට ලක්වී ඇති බව පෙන්නුම් කරයි.

**නියැදිය**

මෙම සමීක්ෂණයෙහි නියැදි රාමුව සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුවෙන් ලබාගන්නා ලද බස්නාහිර පළාතෙහි ස්ථානගත වී ඇති විශාල සමාගම් මත පදනම් වී ඇත. දළ දේශීය නිෂ්පාදිතයට දක්වන ආංශික දායකත්වය පදනම් කර ගනිමින් නිෂ්පාදන සහ සේවා කටයුතු සඳහා මාසිකව අවම වශයෙන් ප්‍රතිචාර 100 බැගින් වූ ඉලක්කයක් පවත්වාගෙන යනු ඇත.

**විචල්‍යයන්ගේ අර්ථ නිරූපණයන්**

| | |
|---|---|
| සේවා නියුක්තිය | : සමාගම සඳහා සේවය ලබාදෙන සේවකයන් ගණන |
| ගැනුම් තොගය | : නිෂ්පාදනය සඳහා යොදාගැනීමේ අරමුණින් මිල දී ගෙන ගබඩාවෙහි තබා ඇති අමු ද්‍රව්‍යය |
| ඇණවුමක් සැපයීමට සැපයුම්කරුවන්ට ගතවන කාලය | : සැපයුම්කරුවෙකුට ඇණවුමක් ලබාදීමෙන් පසු එය කර්මාන්ත ශාලාවට ලැබීමට ගතවන කාලය |
| නිමකිරීමට නියමිත කාර්යයන් | : ව්‍යාපාරික ක්‍රියාකාරකම් ඉහළයාම හේතුවෙන් නිම කිරීමට නොහැකි වූ ඇණවුම් |

අනෙකුත් විචල්‍යයන් ඒවා නම් කිරීම සඳහා යොදා ඇති වචනාර්ථයෙන්ම පැහැදිලි වේ.